# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 2171635 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


---

මගේ අංකය
எனது இலக்கம்
My NO — 1725/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 18/11/2024 පැය 1505

## මාධ්‍ය නිවේදනය

### 01. හදිසි ගිනි ගැනීමක් - නවගමුව පොලිස් වසම.

2024.11.18 වන දින උදෑසන කාලයේ නවගමුව රෝහලේ හදිසි ගින්නක් පැතිර බවට ලද පණිවිඩයක් අනුව නවගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් එම ස්ථානයට ගොස් කෝට්ටේ මහ නගර සභාවේ ගිනි නිවීමේ ඒකකයේද සහය ඇතිව ගින්න මැඩ පැවැත්වීමට කටයුතු කර ඇත.

මෙම ගින්න හේතුවෙන් රෝහලේ (කන්ටේනර් පෙට්ටියක) ගබඩා කර තිබූ ඖෂධ, ශල්‍ය උපාංග හා සැරහුම් උපාංග ගින්නට හසුවී ඇති බවට නිරීක්ෂණය වී ඇත.

ගින්නට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර අපරාධ ස්ථාන පරීක්ෂක නිලධාරීන් සහ රජයේ රස පරීක්ෂක නිලධාරීන් කැඳවා 5නවගමුව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - ගෝනුපීනුවල පොලිස් වසම.

2024.11.18 වන දින උදෑසන කාලයේ ගෝනුපීනුවල පොලිස් වසමේ ගොනුපීනුවල 04 හන්දිය ආසන්න ප්‍රදේශයේ වෙළඳසැලක් අසල දෙමහල් ගොඩනැගිල්ලක නාඳුනන පිරිමි පුද්ගලයෙකුගේ මෘත ශරීරයක් ඇති බවට ගෝනුපීනුවල පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**රූප විස්තර - වයස අවුරුදු 40 ක් පමණ වන අතර, උස අඩි 05 අඟල් 04 කි. මරණකරු නිල් පැහැ කොට කලිසමක් සහ කලු හා රතු මිශ්‍ර කොටු සහිත අත් කොට ටීෂර්ටයක් හැඳ සිටී.**

මෘත ශරීරය සම්බන්ධයෙන් හදිසි මරණ පරීක්ෂණය සිදුකර කරාපිටිය මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, මරණකරුගෙ අනන්‍යතාව මෙතෙක් තහවුරු වී නොමැත.
ගෝනුපීනුවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - ගලේවෙල පොලිස් වසම.

2024.11.18 වන දින උදෑසන කාලයේ ගලේවෙල පොලිස් වසමේ අඹේපුස්ස ත්‍රිකුණාමලය මාර්ගයේ කලා වැව හන්දිය ආසන්නයේදී කුරුණෑගල දෙස සිට දඹුල්ල දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් මාර්ගය හරහා ගමන් කළ පුද්ගලයකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියදුරු හා පදිකයා තුවාල ලබා ගලේවෙල රෝහලට ඇතුලත් කර ඇති අතර බරපතල තත්ත්වයේ පසු වූ පදිකයයා වැඩිදුර ප්‍රතිකාර සඳහා දඹුල්ල රෝහලට අතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වූ තොරටියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ගලේවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - මුල්ලේරියාව පොලිස් වසම.

2024.11.18 වන දින උදෑසන කාලයේ මුල්ලේරියාව පොලිස් වසමේ කැලණිමුල්ල ආසන්න ප්‍රදේශයේදී කැළණි ඟගෙහි වතුරේ නාඳුනන මල සිරුර් පාවෙන බවට ලද තොරතුරක් මත මුල්ලොරියාව පොලිසිය විසින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ත් 50ත් අතර පමණ වන අතර කලු පැහැ කලිසමක් සහ කහ පැහැ ටීශර්ටයක් හැඳ සිටී.**

මෘත ශරීරය සම්බන්ධයෙන් හදිසි මරණ පරීක්ෂණය සිදුකර කොළඹ මුලික රොහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, මරණකරුගෙ අනන්‍යතාව මෙතෙක් තහවුරු වී නොමැත.
මුල්ලේරියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - රත්නායකපුර පොලිස් ස්ථානය.

2024.11.18 වන දින උදෑසන කාලයේ රත්නායකපුර පොලිස් වසමේ කඩිගාව ප්‍රදේශයේදී රත්නායකපුර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 77 ක් වන කඩිගාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රත්නායකපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - තලංගම පොලිස් වසම.

2024.11.18 වන දින අළුයම් කාලයේ තලංගම පොලිස් වසමේ කඩුවෙල කොල්ලුපිටිය මාර්ගයේ කොස්වත්ත මංසන්ධිය ආසන්නයේදී පානදුර දෙස සිට මහනුවර දෙසට ධාවනය වූ බස්රථයෙහි පිටුපස පා පුවරුවෙහි ගමන් කළ කොන්දොස්තරවරයා සහ තවත් මගියෙකු බස් රථයෙන් ඉවතට විසි වීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් කොන්දොස්තරවරයා සහ මගියා තුවාල ලබා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී කොන්දොස්තරවරයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 69 ක් වූ බඳුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**